24 වන පිටෙන්

මුත්‍රා භාජනයෙන් හෝ රුධිර පරීක්ෂණ උපකරණයෙන්ද ඇය සඳහා කෙරුණු ප්‍රතිකාරයක්ද නැත. එම රෝහලෙන් බලෙන් ටිකට් කප්පවා ගෙන පුද්ගලික රෝහලකට ඇතුළත් කරන විටද මව සම්පූර්ණ සුවය ලබා සිටියේ නැත. සිද්ධිය මම එය ලිඛිතව එම රෝහලේ අධ්‍යක්ෂකවරයාට දැන්වූවද, එයද හොරාගේ අම්මාටම ගතු කීමක් වැනි වූ නිසා එයින් අත්වූ යහපතක්ද නැත.

වෛද්‍යවරුන් ප්‍රමුඛ රෝහලේ කීප දෙනෙකු රෝගීන්ගේ ඥාතීන් කොල්ල කෑවේ එලෙසය. රෝගීන් ගේ තත්ත්වය බරපතල කර පෙන්වා ඔවැනි දේවල් ලබාගන්නවා වෙනුවට යම් දෙයක් පරිත්‍යාගයක් ලෙස ලබා ගන්නට උත්සාහ කළා නම් එම රෝහල හෝ වෛද්‍යවරුන් ගැන මීට වඩා පහන් හැඟීමෙන් මෙහි ලියැවෙන්නට බොහෝ ඉඩ තිබිණ.

වෛද්‍යවරියක ගේ අකරුණික බවක් පසුබිම් කොට ගෙන වරක් මා පුවත්පතකට යොමු කළ ලිපියක් ''විශේෂඥ වෛද්‍යවරුන් රෝගීන්ට ලබා දෙන්නේ විශේෂඥ දැනුමද? විශේෂඥ ගෑස්ද?'' යනුවෙන් සතිපතා පුවත්පතක පළ වුණද, රෝහල තුළ සිදුවන එවැනි දෑ පෙන්වා දීම ගැන ඔවුන් ස්තුතිවන්ත වූවා මිසෙක; එම පෞද්ගලික රෝහල් අධිකාරිය හෝ එහි ප්‍රධාන වෛද්‍යවරයා ඒ ගැන කලබල වූයේ නැත.

වරෙක අළුත උපන් බිළිඳියකගේ අතකට දැමූ වෙළුම් පටියක් ඇඟිල්ල සමඟම කපා දැම්මේද හෙදියක විසින්මය. එය අත් වැරදීමක් ලෙස හෝ වැරැද්ද පිළිගන්නවා වෙනුවට ' අතකට එම ඇඟිල්ල තිබුණත් එය වැඩි ප්‍රයෝජනයක් ගන්නා ඇඟිල්ලක් නොවේ' යයි කියමින් එය සාධාරණීකරණය කරන්නට එම හෙදිය උත්සාහ දරා තිබිණ.

වෛද්‍යවරයෙකු වශයෙන් ඔබට හෝ ඔබ පවුලේ උදවියට මෙවන් අසාධාරණයන් සිදු නොවූ බවට සැකයක් නැත. මා මේ හෙළි කළේ ඔබ නොදන්නේ යැයි හැඟෙන සිදුවීම් වල අංශු මාත්‍රයක් පමණක් වුවද හෙළි නොවන තව කොතෙක් සිදුවීම් ලංකාවේ ඇතිද?

මගේ යෝජනාවන් අප රටේ සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්නැයි ඔබ යෝජනා කොට තිබිණි. උගත්කමින් ඉහළ මට්ටමක සිටින, අපේ අමාත්‍යාංශවල ඉහළ පුටුවල වැජඹෙන නිලධාරීන් සාමාන්‍ය පුර-වැසියන්ගේ යෝජනා භාර ගැනීමට සැදී පැහැදී සිටින බවක් ඔබ කියනා තුරු මා දැන සිටියේද නැත. නමුත් සාමාන්‍ය පුරවැසියන්ගේ යෝජනා කොතෙක් දුරට අප රටේ ක්‍රියාත්මක වන්නේදැයි මේ සිදුවීමෙන් ඔබට තේරුම් ගත හැකි වේයැයි සිතමි.

වරක් අබුඩාබියේ කළ සංචාරයකින් පසුව එහිදී දුටු අපේ රටටත් ගැලපෙන දෙයක් ලිපියකින් මම පුවත්පතකට යොමු කළෙමි. අබුඩාබියේ කුලී රථ සේවාවෙන් ගමන් යන බොහෝ දෙනෙක් කාන්තාවෝ වෙති. සෑම කුලී රථයකම රියැදුරු අසුන පසුපස කුලී රථය අයිතිකරුගේ නම, ලිපිනය, රථයේ අංකය, රියැදුරුගේ ඡායාරූපය, නම, දුරකථන අංකය ඇතුළු විස්තර සහිත පත්‍රිකාවක් සවිකොට තිබීම අනිවාර්ය නීතියකි. කුලී රථයකින් යන යම් මගියෙකුට සිදුවන අකටයුත්තක් පොලීසියට පැමිණිලි කරද්දී පැමිණිලි කරන්නා විසින් ඉහත සඳහන් කරුණු ඒ සඳහා ඉදිරිපත් කළ යුතුය. ඒ; රථය හා රියැදුරු හඳුනා ගැනීම සඳහා ඉවහල් වන්නේ ඒ කරුණු බැවිනි. කිසිම කෙනෙකුට මෙම තොරතුරු රහිතව පොලීසියට කුලී රථ සේවාවන් පිළබඳව කිසිම පැමිණිල්ලක් කළ නොහැකිය.

අප රටේද ත්‍රී රෝද රථ නිසා ඇතිවන ව්‍යසනයන් අවම කර ගැනීම සඳහා මා මෙවැන්නක් අප රටේ ත්‍රීරෝද සඳහාද ගැලපේ යැයි යෝජනා කරමින් ලියූ ලිපියක් කාගේ හෝ අවධානයකින් සාර්ථක කරන්නට පොලිස් මූලස්ථානය මගින් වැඩ පිළිවෙලක් දියත් කොට තිබිණ. ත්‍රීරෝද රථ රියැදුරන් එක් රැස් කොට අගනුවරදී සාකච්ඡාවක් පවත්වා පොලීසිය ඒ ගැන ඔවුන් දැනුවත්කොට ඔවුන්ගේ අදහස් විමසා බලා තිබිණ. මගේ දැනීමේ හැටියට එය මසක පමණ කාලයක් අගනුවරදී ක්‍රියාත්මක වී ද තිබිණ. නමුත් අපේ රටේ හෝ ජාතියේ අවාසනාවට පිට පළාත්වල ත්‍රීරෝද රියැදුරන් එයට එකඟතාවය පළ කොට තිබුණේ නැත. හේතුව ලෙස ඔවුන් දක්වා තිබුණේ එම ත්‍රීරෝද රථ ඔවුන්ට රජය මගින් සැපයූවක් නොව ඔවුන්ගේ පෞද්ගලික බර පැන දරමින් ලබාගත් ඒවා වීමය. නමුත් එහි ගමන් ගන්නේ සාමාන්‍ය මගී ජනතාව මිස ඔවුන්ගේ පවුල්වල අය පමණක්ම නොවන බව පෙන්වා දෙන්නට තරම් කෙනෙක් ඉදිරිපත් නොවීම හේතුවෙන් එය ලත් තැනම ලොප් විය. නමුදු රටක පාලන තන්ත්‍රය මගින් මෙවැනි දෙයක් අනිවාර්ය යැයි නීතිගත කළොත් එය ඔවුන්ගේ පෞද්ගලික වියදමින් ගත්තක් බව කියමින් ඔවුන්ට නීතියට පිටුපා යා හැකිද?

රටේ සාමාන්‍ය ජනතාවගේ යෝජනා හා අදහස් පිළිගැනීමට හා ක්‍රියාත්මක කිරීමට සුසැදි පාලනයක් අපට හිමි විණි නම් මා පමණක් නොව මගේ මව ඉපැදුණු කාලයේද තුන්වැනි ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටක් යැයි හංවඩු ගැසුණු අපේ රට අදද එක තැන පල්වන්නේ නැත. එසේ නම් ඔබත්, මමත් මෙහි ජීවත්වන බොහෝ ශ්‍රී ලාංකිකයනුත් මව්බිම හැරදා විත් නොරට සේවයේ යෙදෙන්නේද නැත.

ඔබේ ලිපියේ සඳහන් කළ සෑම වචනයක්ම ඔබේ හෘද සාක්ෂියට එකඟව සාධාරණදැයි සිතා බලන්න. මා එසේ කියන්නේ අපේකම රැකගන්නට අපි සුද්දන් සමඟ තර්ක විතර්ක කළාට මේ දේවල් වල සත්‍යතාවය දන්නේ ලාංකිකයන් වන අපම පමණක් නොවේද? මා මගේ ලිපිවලින් සෑමවිටම උත්සාහ කරන්නේද කාගේ හෝ අප දකින හොඳක් හෝ අගය කළ යුත්තක් තව කෙනෙකුට ආදර්ශයට ගත හැකි බව පෙන්වා දීමටයි.


සුදු පැහැ යමක් කළු පැහැ ගන්වන්නටත්, කළු පැහැ දෙයක් සුදු පැහැ ගන්වන්නටත් උත්සාහ කරනවාට වඩා සුදු දෙයක් සුදු පැහැයෙනුත්, කළු දෙයක් කළු පැහැයෙනුත් දකින්නට ඔබ උත්සාහ කළා නම් ඔබේ ලිපිය මටද බෙහෝ ප්‍රයෝජනවත් වීමට ඉඩ තිබිණ.

එමෙන්ම ඔබ වෛද්‍යවරයෙකු වුවද සමහර විට ඔබවත් නොදන්නා සැඟවුණු දක්ෂතා ඔබ තුළ ඇති බව ඔබේ ලිපියෙන් මම තේරුම් ගතිමි. ඔබේ වෘත්තිය දැනුම ප්‍රයෝජනයට ගනිමින් මිනිසුන්ට ප්‍රයෝජනවත් විය හැකි යමක් ලියන්නැයි මම ඔබට ඇරයුම් කරමි. අප පුවත්පතේ සංස්කාරකවරයාද නිතරම අන් අයට අත දෙන්නට සැදී පැහැදී සිටින නිසා ඔබේ අදහස් වලට එහි ඉඩක් ලැබෙනවා නො-අනුමානය. ■

# The Challenge

විවේකයට විනෝදයට මේ අභියෝගය විසඳන්න. A රූපය හා B රූපය බැලූ බැල්මට එක හා සමාන ය. නමුත් A රූපයේ නැති වැරදි 10 ක් B රූපයේ ඇත. හැකි නම් ඒ වැරදි 10 සොයාගන්න. B රූපය මත ඒ වැරදි රවුමකින් ලකුණු කරන්න. එසේ ලකුණු කළ B රූපය කපා අපට එවන්න. නිවැරදි විසඳුම් අතරින් තෝරා ගන්නා අයෙකුට **Sooriya Marketing Services** වෙතින් දුරකථන කාඩ්පත බැගින් හිමි වෙයි. අපේ ලිපිනය The Challenge Sannasa 22 Lorne Street Lalor Vic 3075

පසුගිය මාසයේ විසඳුම



*ගිය මාසයේ ජයගත් අයගේ නාම ලේඛණය ලබන කළාපයෙන් බලාපොරොත්තු වන්න*

*සිතුවම - සුනිල් කුමාර අමරකෝන්*

නම ............................................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න).

..........................................................................................................

A



B



www.thisara.com
www.sannasa.net
www.kwtapathpawra.com